# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1797/2 – 2013 පෙබරවාරි 11 වැනි සඳුදා – 2013.02.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 46 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2012/ඩබ්එස්/110.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බ/ඉ/1/3/28(11).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 07 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, බණ්ඩාරගම.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්මන්පිල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ka/BND/12/185 හා 2012.09.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0555 ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලි අට (08) ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – අඹවලවත්ත හෙවත් අඹලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0012 ක් පමණ**

උතුරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹවලවත්ත හෙවත් අඹලවත්ත; නැගෙනහිරට: ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹවලවත්ත හෙවත් අඹලවත්ත සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී; දකුණට: කේ. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ එච්. වීරසිංහ හිමිකම් කියන අඹවලවත්ත හෙවත් අඹලවත්ත; බටහිරට: ඇළ.

02. **කැබලි අක්ෂර 'බී' – අඹලකොටුවෙකට්ටිය – ප්‍රමාණය: හෙක්. 0.0026 ක් පමණ**

උතුරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; නැගෙනහිරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී; දකුණට: අයි. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ කේ. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; බටහිරට: එච්. වීරසිංහ හිමිකම් කියන අඹවලවත්ත හෙවත් අඹලවත්ත සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ.

1A – G 17266 – 415 (2013/01)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. කැබලි අක්ෂර 'සී' – අඹලකොටුවෙකට්ටිය – ප්‍රමාණය: **හෙක්. 0.0047 ක් පමණ**

උතුරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; නැගෙනහිරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඩී; දකුණට: ඩී. ටී. කුරුප්පු හිමිකම් කියන අඹලකොටුවෙ-කට්ටිය සහ අයි. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; බටහිරට: කේ. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී.

04. කැබලි අක්ෂර 'ඩී' – අඹලකොටුවෙකට්ටිය – ප්‍රමාණය: **හෙක්. 0.0044 ක් පමණ**

උතුරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; නැගෙනහිරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ ජල මාර්ගය; දකුණට: ජල මාර්ගය, ඩී. ටී. කුරුප්පු හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; බටහිරට: අයි. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී.

05. කැබලි අක්ෂර 'ඊ' – අඹලකොටුවෙකට්ටිය – ප්‍රමාණය: **හෙක්. 0.0083 ක් පමණ**

උතුරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; නැගෙනහිරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ ජල මාර්ගය; දකුණට: ජල මාර්ගය සහ ඩී. ඩී. කුරුප්පු හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; බටහිරට: ඩී. ඩී. කුරුප්පු හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ ජල මාර්ගය.

06. කැබලි අක්ෂර 'එෆ්' – අඹලකොටුවෙකට්ටිය – ප්‍රමාණය: **හෙක්. 0.0080 ක් පමණ**

උතුරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; නැගෙනහිරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ජී; දකුණට: ජී. ඒ. ඩී. කේ. එල්. වීරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ එම්. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙ-කට්ටිය; බටහිරට: එම්. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ ජල මාර්ගය.

07. කැබලි අක්ෂර 'ජී' – අඹලකොටුවෙකට්ටිය – ප්‍රමාණය: **හෙක්. 0.0102 ක් පමණ**

උතුරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; නැගෙනහිරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ ජල මාර්ගය; දකුණට: ජල මාර්ගය සහ ජී. ඒ. ඩී. කේ. එල්. වීරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය, එම්. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර එෆ්; බටහිරට: එම්. අමරසිංහ හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර එෆ්.

08. කැබලි අක්ෂර 'එච්' – අඹලකොටුවෙකට්ටිය – ප්‍රමාණය: **හෙක්. 0.0161 ක් පමණ**

උතුරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; නැගෙනහිරට: ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය, මාර්ග (මා.සං.අ.) සහ ඩී. ටී. කුරුප්පු හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය; දකුණට සහ බටහිරට: ඩී. ටී. කුරුප්පු හිමිකම් කියන අඹලකොටුවෙකට්ටිය සහ ජල මාර්ගය.

03 - 06

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

1991 නොවැම්බර් මස 20 වැනි දින අංක 689/14 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1991 අංක 167 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත පළවන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: එල්/03/ජේ/91/එල්ආර්බී/110 - (11 වෙළුම).
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ
අංකය: ජීසීඑෆ්/අත්/එන්ජී/10/එල්ආර්.
2013 පෙබරවාරි මස 05 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 522, පිටකෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ (කොට්ඨාස අංක 6, පිටකෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ නගර සභා සීමාව තුළ) පිටකෝට්ටේ ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද 2012.10.12 දින සංශෝධිත මු.පි.කො. 7389 දරන මූලික පිඹුරේ කැබලි අංක 53 වශයෙන් පෙන්නුම් කරන ලද ප්‍රමාණයෙන් හෙක්. 0.0234 ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් බිම් කොටසට මායිම්:

01. **කැබලි අංක 53 – ලිඳමුල්ල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0234**

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 23 සහ 52; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 52 සහ 25; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 25 සහ 54; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 54 සහ 23.

03 - 07

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 325**

මගේ යොමු අංකය: 4/3/4/2011/ඩී/352.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 7/3/1/යුධ/හමු/අත්.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට යටත්ව අංක 1791/37 හා 2013.01.04 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 2ඒ පිටුවේ පළකරන ලද 2012 අංක 325 දරන ආඥාවේ "ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා - ප්‍රාදේශීය ලේකම්, **මාතලේ**" යන්න වෙනුවට "ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා - ප්‍රාදේශීය ලේකම්, පල්ලේපොල" යන්න ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 07 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6,
"මිහිකත මැදුර',
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

03 - 08

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.